INSTITUTE FOR HEALTH POLICY

72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 ඔක්තෝම්බර් 25
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව 12.01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රින් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya


# සැප්තැම්බර් මාසයේදී අනුර කුමාර දිසානායකට අපේක්ෂිත ඡන්දදායකයන්ගෙන් ලැබෙන සහය 46% දක්වා වැඩිවේ

## *2023 සැප්තැම්බර් IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම*

2023 සැප්තැම්බර් IHP ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය (SLOTS) MRP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය මත ඇස්තමේන්තු අනුව, NPP/JVP නායක අනුර කුමාර දිසානායක මාසයක් තුළ ලකුණු 7 කින් වැඩිව 46% ක අපේක්ෂිත ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන ඇති අතර SJB නායක සජිත් ප්‍රේමදාස 29% ක ප්‍රතිශතයකින් ලබා ගනිමින් දෙවැනි ස්ථානයේද, ජනාධිපති රනිල් වික්‍රමසිංහ 17%ක් ලබා ගනිමින් තුන්වැනි ස්ථානයේ රැඳී සිටියි.



පසුගිය මාස තුන තුළ වැඩි පිරිසක් NPP/JVP නායකයාට සහාය දැක්වීමට පටන් ගෙන ඇති අතර අනෙකුත් ප්‍රධාන පක්ෂවල නායකයින් සඳහා සහයෝගයේ සුළු අඩුවීමක් දක්නට ලැබේ.




**අදාළ වාර්තා**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, “2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී.”, SLOTS වාර්තාව #2023-06. https://www.ihp.lk/publications/docs/SLOTSReport202306.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, “2023 මාර්තු IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: අනාගත ජනාධිපතිවරණයකදී අනුර කුමාර දිසානායක (48%) සජිත් ප්‍රේමදාස (37%) අභිබවමින් පෙරමුණ ගනියි.”, SLOTS වාර්තාව #2023-12. https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230420.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මැයි, “2023 අප්‍රේල් IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: අනුර කුමාර දිසානායකට ලැබෙන සහයෝගය 45% දක්වා පහත වැටුණත් ඔහු තවමත් සජිත් ප්‍රේමදාස (37%) ට වඩා පෙරමුණෙන් සිටියි”, IHP මාධ්‍ය ප්‍රකාශය #2023-16. https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230526.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූනි, “2023 මැයි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: මැයි මාසයේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ ශ්‍රී.ල.පො.පෙ. ට ඇති සහයෝගයේ වර්ධනයක්”, IHP මාධ්‍ය ප්‍රකාශය #2023-19. https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306302.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූලි, “2023 ජූනි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: 2023 ජූනි මාසයේදී AKD 40%, සජිත් 35%, රනිල් 15% වශයෙන් අපේක්ෂිත ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රායේ සුළු වෙනසක්”, IHP මාධ්‍ය ප්‍රකාශය #2023-23. https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230728.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අගෝස්තු, “2023 ජූලි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයකදී ජනාධිපති රනිල් වික්‍රමසිංහට හිමි සහය අඛණ්ඩව වැඩිවෙමින් පවතී”, IHP මාධ්‍ය ප්‍රකාශය #2023-27.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230822.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 සැප්තැම්බර්, “2023 අගෝස්තු IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: අනුර කුමාර දිසානායක (38) සහ සජිත් ප්‍රේමදාස (35) ජනාධිපතිවරණ ඡන්ද මනාපවල තවදුරටත් ඉදිරියෙන් සිටිති.”, IHP මාධ්‍ය ප්‍රකාශය #2023-31.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230926.pdf යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 සැප්තැම්බර් MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 599ක් සහ 2021 ඔක්තෝබර් 1 සිට 2023 ඔක්තෝබර් 11 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 13,431ක් මත පදනම් වන අතර අනුර දිසානායක, සජිත් ප්‍රේමදාස සහ රනිල් වික්‍රමසිංහ සහ අනෙකුත් ප්‍රධාන අපේක්ෂකයා සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.